**විසර්ජන ශීර්ෂය 182 - විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

## 1.1 විගණන විෂය පථය

විදේශ රැකියා ප්‍රවර්ධන සුභසාධන අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 25 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම්වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය විසින් 2013 මැයි 03 දින විෂය අංක 18201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### (ආ) ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| (i) ණය අත්තිකාරම් පිළිබඳ ණයගැති ලේඛනය | 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය |
| (ii) ණය අත්තිකාරම් පිළිබඳ ණයහිමි ලේඛනය | -එම - |
| (iii) අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් වූ පාලන ගිණුම | -එම - |

### (ඇ) විසර්ජන ගිණුම

#### (i) මුළු ප්‍රතිපාදනය හා වියදම

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.394,175,000 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු.99,047,048 ක්

උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.295,127,952 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 75 ක ප්‍රමාණයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 82,175,000 | 84,175,000 | 14,104,480 | 17 |
| මූලධන | 310,000,000 | 310,000,000 | 281,023,472 | 91 |
| එකතුව | 392,175,000 | 394,175,000 | 295,127,952 | 75 |

**(ii)** **අයවැය විචලනය**

- වැය විෂයයන් 8ක් සඳහා සළසා තිබුණු රු.255,825,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.
- වැය විෂයයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරිමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 52 ත් සියයට 99 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.
- වැය විෂයක රුපියල් මිලියන 9 ක් වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මුදලම මු.රෙ.66 මගින් වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 18201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 1,700,000 | 1,699,933 | 900,000 | 2,155,689 | 7,000,000 | 5,202,715 |

විෂය අංක 18201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.307,085ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

## 1.4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 අභ්‍යන්තර විගණනය

අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිහිටුවා නොතිබුණි.

### 1.4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

අමාත්‍යාංශය විසින් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් 2012 වර්ෂය තුළදී පවත්වා නොතිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

**බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක සිට පැවත එන බැරකම් රු.6,247,787 ක් වූ අතර එම ශේෂයේ ඇතුළත් ගුවන් ටිකට්පත් හා කුලි වාහන සඳහා වූ වියදම පිළිවෙලින් රු.2,251,068 ක් හා රු.3,580,874 ක් වී තිබුණු අතර එම බැරකම් නිරවුල් කිරීමේ තත්ත්වය අසතුටුදායකය.

## 1.6 අනුකූල නොවීම.

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මු.රෙ. 115 (2) | 61,764 | ඉකුත් වර්ෂයට අදාල ගෙවීම් වවුචර් 04 කින් එකතුව රු.61,764 ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණත්, ඒ සඳහා මු.රෙ.115(3) ප්‍රකාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) මු.රෙ. 245(i) | 3,073,742 | ගෙවීම් සහතික කිරීමකින් තොරව ගෙවීම් වවුචර් 11 ක් මගින් ගෙවීම් කර තිබුණි. |
| (iii) මු.රෙ. 396 (ඇ) | 8,650 | 2012 දෙසැම්බර් මස බැංකු සැසඳුමට අනුව නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ක් කල් ඉකුත්වූ චෙක්පත් 02 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) මු.රෙ. 1646 | - | අමාත්‍යාංශය සතු වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**(ආ) ජනාධිපති ලේකම්**
**කාර්යාලයේ චක්‍රලේඛ**

---------------------------

| | | |
|---|---|---|
| 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය 4: 2 ඡේදය | - | චක්‍රලේඛයට පටහැනිව අමාත්‍යවරයාගේ පාවිච්චිය සඳහා ලබා දී තිබූ වාහන 03 සඳහා මාසිකව රු.200,000ක කූපන් පත්වලට ඉන්ධන ලබා දී තිබුණු අතර ඉදිරි මාස සඳහා ද ඉන්ධන කූපන් පත් මිලදී ගෙන තිබුණි. |

## 1.7 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 2.1 සහ 3.4 ඡේදය ප්‍රකාර අමාත්‍යවරයාගේ කාර්යය මණ්ඩලයේ සම්බන්ධීකරණ ලේකම්වරු සහ මාධ්‍ය ලේකම්වරයාට රාජ්‍ය අරමුදලින් වාහන පහසුකම් ලබා දී තිබුණි. ඊට පටහැනිව අතිරේක සම්බන්ධීකරණ ලේකම්වරයෙකුට සහ අතිරේක මාධ්‍ය ලේකම්වරයෙකුට පිළිවෙලින් රු.837,576 ක් සහ රු.1,345,840 ක් මාසික කුලියට විදේශ සේවානියුක්ති කාර්යාංශය මගින් කුලී පදනම මත වාහන ලබාදී තිබුණි.

(ආ) 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාර අමාත්‍යාංශයේ මාධ්‍ය ලේකම්වරයාට විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයෙන් නිලරථයක් ලබා දී තිබියදී විදේශ සේවානියුක්ති කාර්යාංශය මඟින් ද කුළී වාහනයක් ලබා දී තිබුණි. ඒ සඳහා 2012 ජනවාරි මස සිට 2012 සැප්තැම්බර් 02 දින දක්වා කාලයට මසකට රු.51,975 ක් සහ 2012 සැප්තැම්බර් 03 සිට මසකට රු.70,000 බැගින් වාහන කුලියට ගෙන තිබුණු අතර අතිරේක ගමන් වශයෙන් ධාවනය කළ දුර සඳහා රු.660,800 ක් ද එම කාලයට අදාලව ගෙවා තිබුණි.

## 1.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 07 | 05 | 02 |
| තෘතියික මට්ටම | 01 | - | 01 |
| ද්විතියික මට්ටම | 1209 | 25 | 1184 |
| ප්‍රාථමික මට්ටම | 26 | 20 | 06 |
| වෙනත් /තාවකාලික | 04 | 01 | 03 |
| එකතුව | 1247 | 51 | 1196 |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සේවක පුරප්පාඩු 1196 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.